**මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020**

මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම සහ ඌව පළාත්වල කිලෝමීටර් 62.06 ක් වූ ජාතික මාර්ග සහ කිලෝමීටර් 2.25 ක් වූ පළාත් මාර්ග ඇතුළු ව කිලෝමීටර් 64.31 ක් වූ මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සහ පාලම් 13 ක් ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 12,674.90 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 10,774.74 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 85 ක් චීන අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 1,900.16 ක වටිනාකම ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 නොවැම්බර් 29 දින ආරම්භ කරන ලද අතර 2020 නොවැම්බර් 28 දින අවසන් කිරීමට නියමිතය.

## 1.3 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ඇතුලත් මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරුවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ණය පොලී සහ ප්‍රමාද ගාස්තු පිළිවෙලින් රුපියල් මිලියන 78 ක් සහ රුපියල් මිලියන 133 ක් විය. කෙසේ වුවද මෙම ගාස්තු මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | 211 | 2013 නොවැම්බර් 29 දිනැති චක්‍රලේඛ අංක: SA/MA/DO/Circular-2013 ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ණය පොලී සහ ප්‍රමාද ගාස්තු ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කර තිබුණි. | ණය පොලී සහ ප්‍රමාද ගාස්තු ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අනුව ණය ශේෂය සහ භාණ්ඩාගාර ප්‍රකාශන අනුව ණය ශේෂය අතර නිරීක්ෂණය වූ වෙනස සඳහා සැසඳුම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | 622 | මෙම රුපියල් මිලියන 622 ක වෙනස සඳහා 2019 වසරේ දී මහා භාණ්ඩාගාරය විසින් ණය ගැනීම් සීමාවන් සීමා කිරීම යටතේ ගිණුම්ගත නොකළ ණය ගැනීම් හේතු වී ඇත. | මේ සම්බන්ධයෙන් සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කළ යුතුයි. |

**3.** **භෞතික කාර්යසාධනය.**

**3.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

ව්‍යාපෘති ක්‍රියාකාරකම් මාර්ග පැකේජය සහ පාලම් පැකේජය යන පැකේජ 02 කින් සමන්විත වේ. මාර්ග පැකේජයේ සහ පාලම් පැකේජයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 86ක් සහ සියයට 46ක් විය.

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය.**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2013 නොවැම්බර් 22 දින පැවති කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවට අනුව ව්‍යාපෘති යෝජකයාගේ පිරිවැය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රුපියල් මිලියන 2,072.72 කින් වැඩි විය. කෙසේ වුවද, මෙම වියදම් වෙනස නොසලකා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. | මෙය චීන අපනයන හා ආනයන බැංකුව (හුනාන් ශාඛාව) විසින් අරමුදල් සපයන ලද තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව සිදුකරන ලද ව්‍යාපෘතියකි. ඇස්තමේන්තුගත පිරිවැය යෝජනාව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ කරන ලදී. කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව කරන ලද නිරීක්ෂණ සහ අදහස් දැක්වීම් වලින් පසුව, මෙය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර එම යෝජනාවට සහ ඇස්තමේන්තුගත පිරිවැය සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. | ඉංජිනේරු ඇස්තමේන්තුව මත පදනම්ව තීරණය ගත යුතුය. |
| 2014 ජූලි 09 දිනැති ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශයට අනුව, මාර්ග කොටස් 4 ක ශුද්ධ වර්තමාන අගය (NPV) සෘණාත්මක වූ අතර මාර්ග කොටස් 2ක සහ පාලම් සඳහා අභ්‍යන්තර ඵලදා අනුපාතයද (IRR) සෘණාත්මක විය. නමුත් ව්‍යාපෘති ඇගයීම් ප්‍රතිඵල නොසලකා එම මාර්ග කොටස් සහ පාලම් සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. | මෙය චීන අපනයන හා ආනයන බැංකුව (හුනාන් ශාඛාව) විසින් අරමුදල් සපයන ලද තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව සිදුකරන ලද ව්‍යාපෘතියකි. ඇස්තමේන්තුගත පිරිවැය යෝජනාව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ කරන ලදී. කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව කරන ලද නිරීක්ෂණ සහ අදහස් දැක්වීම් වලින් පසුව, මෙය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර එම යෝජනාවට සහ ඇස්තමේන්තුගත පිරිවැය සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. | මාර්ග කොටස් තෝරාගැනීමේ දී ව්‍යාපෘති ඇගයීම් ප්‍රතිඵල සලකා බැලිය යුතුය |